# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2322/34 - 2023 මාර්තු මස 08 වැනි බදාදා - 2023.03.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

**ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 අධිකාරය)**

38(3) උපවගන්තිය යටතේ වූ නියමය

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (සංශෝධිත) 38(1)(ඇ) වගන්තිය යටතේ මා විසින් පළ කරන ලද අංක 2317/08 හා 2023.01.30 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් කළ පරිදි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් පළාත් පාලන ආයතන සඳහා වූ ඡන්ද විමසීම 2023 මාර්තු මස 09 වැනි දින නොපැවැත්වෙන බව ද,

මැතිවරණ කොමිෂන් සභාවේ පාලනයෙන් පරිබාහිර අනපේක්ෂිත හා නොවැළැක්විය හැකි කරුණු හේතු කොටගෙන එකී ඡන්ද විමසීමේ දිනය කල් දැමීමට සිදු වී ඇති බැව් මැතිවරණ කොමිෂන් සභාව විමසීමෙන් අනතුරුව එකී කොමිෂන් සභාව විසින් මා හට උපදෙස් දී ඇති හෙයින් ද,

එකී පළාත් පාලන ආයතනවලට අදාළ නව ඡන්ද විමසීමේ දිනය වශයෙන් 2023 අප්‍රේල් මස 25 වැනි දිනය මවිසින් මෙයින් නියම කරන බව ද,

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (සංශෝධිත) 38(1)(ඇ) උප වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 38(3) උප වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ශාන්ත වීරසිංහ,**
තේරීම්භාර නිලධාරී,
ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය.

2023 මාර්තු මස 08 වැනි දින,
ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

1A - G 39052 — 31 (2023/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

ගාල්ල මහා නගර සභාව
අම්බලන්ගොඩ නගර සභාව
හික්කඩුව නගර සභාව
බලපිටිය ප්‍රාදේශීය සභාව
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව
වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව
බෙන්තොට ප්‍රාදේශීය සභාව
නෙළුව ප්‍රාදේශීය සභාව
තවලම ප්‍රාදේශීය සභාව
නාගොඩ ප්‍රාදේශීය සභාව
නියාගම ප්‍රාදේශීය සභාව
බද්දේගම ප්‍රාදේශීය සභාව
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව
රජ්ගම ප්‍රාදේශීය සභාව
අක්මීමණ ප්‍රාදේශීය සභාව
බෝපේ - පෝද්දල ප්‍රාදේශිය සභාව
ඉමදූව ප්‍රාදේශීය සභාව
හබරාදූව ප්‍රාදේශීය සභාව

EOG 03 - 0092

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.